# සහෝදර දෑත්

**එදිරිවීර විජේසූරිය.**

උතුරු මෙල්බර්න් මිතුරු කැළගේ උට්ඨාන වීර්යය, ශක්තිය සහ ධෛර්යය මතින් ''සහෝදර දෑත්'' රාත්‍රී භෝජන සංග්‍රහය ප්‍රමුඛ සංගීතමය සන්ධ්‍යාව 2016 ජූලි 29 වන සිකුරාදා රාත්‍රී 7.30 ට එපිං හි ඔයැ ෆැරසවීටැ උත්සව ශාලාවේදී අති උත්කර්ෂවත් අයුරින් පවත්වන්නට දැන් සියළුම විධි විධාන සූදානම්ය.

''සහෝදර දෑත්'' නම් මේ සාමූහික ප්‍රයත්නයේ සම්පූර්ණ ආදායම ඉඳුරාම යොමුවන්නේ මෑත කාලීන අකල් ජල ගැල්මෙන් විපතට පත් අප ශ්‍රී ලංකාවාසී සහෘදයන් හට අත හිත දීමේ නොනිමි සමාජ සත්කාරය වෙනුේ බැව් සතුටින් සඳහන් කරමි.

පියෙන් පිය, බිඳෙන් බිඳ ගොඩනගා දිනාගත් ජීවිත අසුරු සැණ ණපිට හැරවූ සොබාදමේ මේ රුදුරු ව්‍යසනය නිා අසරණ වූ, මව්බිමේ අපේම සෑසියන්ගේ සෝබර තොරතුරු කොතෙකුත් අප පසුගිය කාල වකවානුව පුරාවට විවිධ මාධ්‍යයන් සහ අන්තර්ජාලය ඔස්සේ නිරතුරුවම ඇසුවෙමු, දුටුවෙමු.

සංවේදී සිත් ඇති උතුරු මෙල්බර්න් මිතුරු කැළගේ මේ කැපවීම, ඒ දුක් කඳුලැලි නිවාලන්නට සිය ශක්ති ප්‍රමාණයෙන් උපරිම දායකත්වය ලබා දීමටයි. ''සහෝදර දෑත්'' නිර්මාණය වූයේ ශ්‍රී ලාංකීය ජන සමාජයේ, සිංහල, දමිළ, මුස්ලිම් යන ජන කොට්ඨාශ තුනම නියෝජනය වන පරිදි ජල ගැල්මෙන් විපතට පත් දරු පවුල් තුනක් තෝරා ඔවුනට අහිමි වූ ගේ දොර වෙනුවට නිවාස තුනක් ඉදිකරවා දීමේ හෝ ඒ සඳහා අවශ්‍ය පූර්ණ යටිතල පහසුකම් සපයා දීමේ පරම අභිලාෂය ඇතිවය.



අන් හදක දුක, වේදනාව, තමාටම වූ දෙයක් සේ සලකා විපතේදී පිළිසරණට එකතුවන පරහිතකාමී උතුම් මානුෂීය ගුණධර්මය ඉස්මතු කරමින් ''සහෝදර දෑත්'' හා බැඳී යෝධ ශක්තියක් සපයන හිතෛෂීවන්තයින් පිළිබඳව මෙහිදී කෘතවේදී ව සඳහන් කළ යුතුය.

සහන මිළකට ඔබ වෙත ලබාදීමට නියමිත, ඉහළ ප්‍රමිතියකින් යුත් ප්‍රණීත රාත්‍රී භෝජණය, මුළු බරපැණ ඔවුනොවුන් අතරේ දරාගනිමින්, ''සහෝදර දෑත්'' වෙනුවෙන පිළියල කර දීමට ඔවුහු සෙනෙහසින් ඉදිරිපත්ව සිටිති.

''සහෝදර දෑත්'' වෙනුවෙන් ශබ්ද වාහිනී යන්ත්‍ර සැපයී ඇත්තේ නොමිළයේය. ප්‍රවේශ පත්‍ර මුද්‍රණය වන්නේද පරිත්‍යාගලියකුගේ තිළිණයක් ලෙසිනි. ඒ රාත්‍රිය මුළුල්ලේම මියුරු සංගීතයෙන් ඔබ සවන් පිනවීමේ සොඳුරු වගකීමද ඊ-ය්රව සංගීත කණ්ඩායම අප වෙනුවෙන් ස්වේච්ඡාවෙන් ඉටු කර දෙති. සහන මිලට උත්සව ශාලාව අප වෙනුවෙන් ලබා දීමට ඉඩ සැලසීමද මෙහිදී අප ලත් තවත් කාරුණික අනුග්‍රහයකි.

එහෙයින්ම මේ සංවේදී පරිත්‍යාග ශීලීන්ගේ සුපසන් දායකත්වයෙන් ආශිර්වාද ලත් ''සහෝදර දෑත්'' රාත්‍රී භෝජන සංග්‍රහය ප්‍රමුඛ සංගීත රාත්‍රියේදී උපයන සම්පූර්ණ ආදායම, වියදම් පියවීමකින් තොරවම අපේ මුඛ්‍ය පරමාර්ථය සඳහාම වැය කිරීමේ භාග්‍යය දැන් උතුරු මෙල්බර්න් මිතුරු කැළට හිමිව තිබේ.

මෙහිදී අප ලබාදෙන ප්‍රතිපාදන නිසි ලෙස කළමණාකාරණය කරමින් ශ්‍රී ලංාවේ සිදු කරන ඉදිකිරීම් කටයුතු නිම කිරීමට මිතුරු කැළ හා බැඳී ක්‍රියාකරන්නේ පොල්ගස් ඕවිට සිංහ සමාජයයි.

මින්පෙරද 2003 වසරේදී රත්නපුර - අයගම ප්‍රදේශය විපතට පත් කලාවූ රුදුරු ගංවතුර ආපදා අවස්ථාවේදී, මෙල්බර්න් නුවර මෙවැනිම ප්‍රසංග රාත්‍රියකින් එක් රැස් කර දුන් අරමුදල් භාරගෙන, උන්හිටි තැන් අහිමි වූ ප්‍රදේශවාසී දරුපවුල් පහක් වෙනුවෙන් අභිනව නිවාස පහක් තනා නිම කොට පවරාදීමේ භාරදූර කාර්යය භාරය එදා මෙල්බර්න් මිතුරු කැළ වෙනුවෙන් ඉටුකර දුන්නේද ඔවුන්මය. එමෙන්ම 2004 වසරේදී සුනාමි ව්‍යසනයෙන් විපතට පත් වූවන්හට වියළි ආහාර, පොත්පත්, බෙහෙත් ද්‍රව්‍ය, රෙදි පිළි, ඇතුළු අත්‍යවශ්‍ය දෑ මෙරට පරිත්‍යාගශීලීන් වෙතින් රැස්කර පොල්ගස්ඕවිට සිංහ සමාජය මගින්ම අවශ්‍ය වූවන් හට ලබාදීමට කටයුතු සංවිධානය කරන ලදී.

ඒ සත් කාර්යයේදී එදා සිංහ සමාජය දැක්වූ විශ්වාසනීය වගකීමත්, විනිවිද භාවයත් නිසාම මෙදා ''සහෝදර දෑත්'' නමින් මුල පුරන මේ මහඟු සමාජ සත්කාර්යයේදී ද ඔවුන් හා සහ සම්බන්ධව කටයුතු කිරීමට උතුරු මෙල්බර්න් මිතුරු කැළ තීරණය කර සිටී. ඒ සියළු අතීත සේවාවන් පිළිබඳ සවිස්තර වාර්තා සිංහ සමාජය සතු වෙබ් අඩවිය සහ මාසික සඟරා වෙතින් නිරීක්ෂණය කළ හැකිය.

බෙල්බර්න් නුවර වාසී ආදරණීය හිතවතුනි, දැන් ඔබගේ වාරයයි. අකාරුණික වූ සොබාදම් ව්‍යසනය ඉදිරියේ අසරණ වී සිටින අපේම මව්බිමේ අපේම සහෘදයෙකුට, ඇද වැටුන තැනින් යළි නැගී සිට අවතැන් වූ ජීවිතය යළි ස්ථාපිත කර ගැනීමට ශක්තියක් වෙමින් ''සහෝදර දෑත්'' හා එකතු වන්න.

ප්‍රණීත රෑ කෑම වේලකින් සන්තර්පිතව, මියුරු සංගීතයෙන් සැනැහී ඔබගේ ආදරණීය සමීපතමයන් සමග රඟා ගයා ප්‍රීති වන සොඳුරු සන්ධ්‍යාවක් වෙනුවෙන් ඔබ මිළදී ගන්නි ප්‍රවේශ පත්‍රයට වැය වන හැම සතයක්ම යොමුවන්නේ අර්ථාන්විත වූ පුණ්‍යවන්ත මෙහෙවරක් වෙනුවෙනා. 2016 ජූලි 29 වන සිකුරාදා රාත්‍රී 7.30 ට එපිං හි The Heritage ශාලාවේදී ''සහෝදර දෑත්'' හා ඔබ සුරතත් බැඳෙනු දැකීම උතුරු මෙල්බර්න් මිතුරු කැළගේ සාදර අපේක්ෂාවයි.

## චානක ඉලංගගේ 365

**ප්‍රේම්ව මරා දැම්මේ දේශපාලන උවමනාවකට නොවෙයි . කොහොම නමුත් මරා දමලා නැති කරන්න හදපු ප්‍රේමකීර්ති කියන නම අද වෙද්දී සදා නොමැරෙන ලෙස රසික හදවත්වල ජීවත් වෙනවා**

ඔහුව මට හමුවුන විදිහත් මගෙන් වෙන්වුන විදිහත් යන දෙකම හරියට සිහිනයක් වගෙයි .මම මගේ උපාධියට පාඩම් කිරීම සඳහා දෙල්කඳ තට්ටු නිවසක නැවතිලා හිටිය දවස්වලම ප්‍රේමකීර්තිත් ඕන්න ඔය මම හිටපු තට්ටු නිවාසයේම තවත් කාමරයක නැවතිලා ඉඳල තියෙනවා .නමුත් මම දැනගෙන හිටියේ නෑ. දවසක් ගෙදර අයිතිකාර මනුස්සයා තමයි මට කියුවේ ඔය අනිත් කාමරයේ ඉන්නේ ප්‍රේමකීර්ති කියන කෙනා කියල . නමුත් ඉතින් එක මට එතරම් විශේෂයක් උනේ නැහැ. පසුව ඊට ආසන්නම දවසක මට ආපු ලියුම් කිහිපයක් ගෙනත් දෙන්න මගේ ජනේලයට තට්ටු කරලා ඉතාම විනීත විදිහට මට කථාකරල ඒ ලියුම් ටික දීල ගියා. මට තවම මතකයි ඔහු මට ඒ ඉස්සෙල්ලම කියපු වචන ටික "මෙන්න නංගි ලියුම් වගයක් තියෙනවා ඇන්ටි දෙන්න කියුව" කියල ගියා. ඒ ඔහුව මට හමුවූ පළමු දවසයි. පසුව ඉතින් අපි මග තොට දැක්කම කතාබහ කලා හිනා උනා ඔහොම කාලය යද්දී තමයි ඔහු මට ආපහු විවාහය පිළිබඳව විමසලා ලිපියක් දෙන්නේ. හැබැයි මම ඉතින් විවාහයකට සුදා-නමකින් තියා ඒ පිළිබඳව සංකල්පනාවක් වත් ඔලුවේ තිබුනේ නැහැ. මට ඇත්තටම දවස් තුනක් උණ ගත්ත ඔහුගේ යෝජනාවත් එක්කම .මොකද ප්‍රේමකීර්ති කියන්නේ ඒවෙනකොටත් ප්‍රසිද්ධ දැවැන්ත චරිතයක් . ඉතින් එහෙම කෙනෙකුගේ යෝ ජනා-වකට අකමැති වෙලා පසුව නරක ප්‍රතිපලයක් අත්විඳින්න වෙයිදෝ කියන සැකයත් මගේ හිතේ තිබුනා .තවත් පැත්තකින් ඒ වෙන-කොටත් ප්‍රේම කීර්ති කියන්නේ වැඩිහිටියෙක් .දරුවෙකුත් ඉන්න තාත්ත කෙනෙක් කියල රටේ හැමෝම දැනගෙන උන්න .මගේ පවුල් පසුබිමත් එක්ක මේ වගේ කෙනෙක් එක්ක විවාහවෙන්න අපේ ගෙදරින් කොහොමටවත් කැමති නොවන බම මම හොඳටම දැනගෙන උන්න .මම හැදුනේ අයියල දෙදෙනෙකුට සහ මල්ලිලා දෙදෙනෙකුට අතර මැදිවයි . මේ සියලූම දේවල් එක්ක මට මහා බයක් දැනුන .ඉතින් මම ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂේප කළා . එහෙම කරාම ඔහු මට ගෙනත් දෙනවා ලියුම් මල්ලක් .ඔහුගේ ඥාති සොයුරියක් ඔහු වෙනුවෙන් පත්තරේකට දාපු මංගල යෝජනා වකට ආපු පිළිතුරු කියල .

එහෙම ඔහුගේ යෝජනාව ප්‍රතික්ෂේප කරපු මම "නැහැ ඔහුත් සමග මම මේ ගමන යනවා" කියල පසුව වෙනස් වන්නේ ඒ ආසන්න කාලයේදීම ඔහුට සිදුවන රිය අනතුරකුත් සමගයි .මේ අනතුරින් ප්‍රේම්ගේ අතකුත් කකුලකුත් දැඩිලෙස හානි වෙනවා .මට මතකයි මම ප්‍රේම්ව බලන්න ගිහිල්ලා කියනවා "මගේ හිත හිස් ආකාශයක් වාගෙයි ඕන පාටක වළාකුලක් රදවගන්න මට පුළුවන් අතයි කකුලයි දෙකම නැති උනත් ඔලූව තියෙනවනේ අපි එකතුවෙලා මේ ලෝකෙට වැඩක් කරමු"යි කියල.

එතැන් සිට මම මගේ මුළු ජීවිතයම කැපකලේ ඔහු වෙනුවෙන් ඔහු කවුද කියන එක තේරුම් ගැනීමටයි .මම බොහෝවිට පාවිච්චි කලේ මගේ ඇස්දෙක සහ කන්දෙක පමණයි .ප්‍රේම් කියන්නේ ජීවිතය දිහා පවුල දිහා වෙනස්ම විදිහකට බලපු පුදුමාකාර චරිතයක් .මියයන තෙක්ම ගෙදර බොහෝ වෙලාවට උයන පිහන කටයුතු කලේ ඔහුයි . ජීවිතේ ඕනෑම ප්‍රශ්නයකට මුහුනදෙන අකාරය මම ඉගන ගත්තේ ඔහුගෙන් .ඔහු ඒ හැම දෙයක්ම ක්‍රියා-වෙන් කරලා පෙන්නුවා මිසක කිසිම දවසක ඕක මෙහෙම කරන්න අන්න අරවිදිහට කරන්න කියල මට කවදාවත් බල කලේ නැහැ .

මට දරුවා ලැබෙන්න ඉන්නකොට මම මට හැරෙන්න අමාරුයි කියුවහම අනේ ඉතින් මමත් ඒ අමාරුව දරාගන්නම් කියල එයත් නිදියන කොට එකම ඉරියව්වට හැරෙන්නතුව නිදියනවා .ඔය වගේ ඉතාම සියුම් සංවේදී අවස්ථා කප්පරක් මම ඔහුගෙන් අත්දැකලා තියෙනවා .

ප්‍රේම් කිසි දවසක ටයි කෝට් අඳින්න උත්සුක උනේ නැහැ . ඔහු හැම විටම උත්සාහ කලේ සැහැල්ලූ විදිහට අඳින්න .රූපවාහිණියට ගියේ පටි සපත්තු දෙකක් දාගෙන .නිතරම කියපු දෙයක් තමයි හුලං ටිකක් වැදෙන්නති ඇඳුම්වලින් මට මොකද්ද තියෙන පලේ කියල .හෝමාගම අපි හිටපු ගෙදර ඉඳල හැතැප්ම කාළක් විතර දුරින් තිබුනා සියඹලා ගහක් .අනේ මේ රටක් ලෝකයක් දන්නා මනුස්සය සරම කැහපොට ගහගෙන හවසට යනවා සියඹලා අහුලන්න .අඹ ගහක් කොහෙද දැක්කේ වාහනය නවත්තල අඹ අහුලනවා .ප්‍රේමකීර්ති එවැනි සරල සුන්දර ජීවිතයක් ගතකල චරිතයක් . ගහකොළ සතා සිවුපාව එක්ක ඉන්න තමයි නිතරම උත්සහ කලේ. සොභාදහමට පරිසරයට කොච්චර ආදරේ කරාද කියනවනම් ,කොච්චර මුදල් දෙන්නම් කියුවත් ප්‍රේම් කිසිම දවසක වස විස වෙනුවෙන් එකදු ජිංගල් එකක්වත් කලේ නැහැ .දවසක් අපි දෙන්න වාහනේ නැතුව පයින් එනවා 12.45 ගුවන් විදුලියේ පුවත් කියන්න .ඒ එනකොට ප්‍රේම් දකි නවා ලිඳකට වැටුන මීයෙක් එකෙන් ගොඩ වෙන්න බැරුව මරණ බයේ එහෙට මෙහෙට දඟලනවා .ප්‍රේම් පොල් අත්තක් අරගෙන ඒ මීයව ගොඩට දාල තමයි ගුවන් විදුලියට ගියේ .ප්‍රේමකීර්ති කියන්නේ අන්න ඒ වගේ සංවේදී මනුසත් ගති තිබුන උත්තම පුරුෂයෙක් .මග තොට හමුවෙන සතා සිවුපාව පමණක්ම නොවෙයි වතුරක ඉන්න කුහුඹුවෙකු ඇඟිල්ලෙන් ගොඩදාල බේරන කාරණාවේ ඉඳලම ඉතාම සංවේදී චරිතයක් .නමුත් පුදුමයට කරුණ එහෙම මනුස්සයෙකුට කොහොමද ආයුධයක් එල්ල කලේ කියන කාරණය

ප්‍රේම් දරුවන්ට අසීමිතව ආදරය කරපු චරිතයක් .ඔහු දරුවන් වෙනුවෙන් බොහෝ නිර්මාණ කලෙත් අන්න ඒ නිසයි . දවසක් පුතා තොටිල්ලෙන් සෙල්ලම් බඩු විසිකරනවා කියල මම සැරකලාම ටිකකින් බැලින්නම් ප්‍රේමුත් ළමයත් එක්ක තොටිල්ලේ ඇතුලේ .ඔහුගේ ඒ ගතිගුණ ගැන මට සමහර වෙලාවට හිතාගන්නත් බෑ .රත්න සභා මණ්ඩපය වැනි ළමා වැඩසටහන් ප්‍රේම් කලේ ළමයින් වෙනුවෙන්මයි .ඔහු මියයන වකවානුව වෙද්දීත් ගෝනියක් විතර කඩපු නැති ලියුම් තිබුන කුඩා දරුවන් ප්‍රේම්ට එවපු .කුඩා දරුවන් ප්‍රේම්ට ඒ තරම්ම ආදරේකින් තමයි හිටියේ .

ප්‍රේම් ඔහුගේ ජීවිතේ බොහෝ සිදුවීම් සහ අත්දැකීම් කවියට නැගුවා .ඔහු ජනප්‍රිය උනේ ගීපද රචකයෙකු හැටියට උනත් ප්‍රේම් කවි ලියන්න පටන් අරගෙන තිබුනේ ඔහුට වයස අවුරුදු අටේ වගේ කාළයේ ඉඳල .දැනට මුද්‍රිත මාධ්‍යන් ප්‍රචාරයට පත්ව ඇති ඔහුගේ පැරණිතම කවිය හැටියට මා දන්නේ දයානන්ද ජයකොඩි මහතා විසින් මුද්‍රිත හෙලබිම නැමති පත්‍රයට රචිත කවියක් තමයි .1964ටත් කලින් තමයි ඒ කවිය ලියල තිබෙන්නේ .සමහර විට මේ තොරතුරු නිවැරදි නොවෙන්නත් පුළුවන් .නමුත් මා ඔහුගේ බිරිඳ විදිහට පෞද්ගලිකවම දන්නා කාරණයක් තමයි ප්‍රේම් ජීවිතයේ දුක සතුට දෙකම කවියත් එක්ක ඉතා ලෙන්ගතුව බෙදා හදා ගත් බව

ඔහුගේ කවිය පරයා ගීතය තමයි රසිකයින් අතරට ගියේ නමුත් ඔහු කවමදාකවත් කවිය අතහැරියේ නැහැ .ඔහු විසින් රචිත සමහර කවි ජනප්‍රියත්වයට පත්වුණෝ ගීත විදිහිටයි .ප්‍රේමකීර්ති ඔහුගේ අවසාන දවස් කීපයේත් කවි ලියුව .ප්‍රේම් කරුණාරත්න අබේසේකරයන්